ආයතනයේ නම : මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 79

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

நிறுவனத்தின் பெயர் : நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 79

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119 (4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

Name of the Institution : Ministry of Finance, Planning and Economic Development

Parliamentary Series : 79

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

ආයතනයේ නම	:	මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක	:	**79**

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක **119(4)** යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 79

රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව

පටුන

අනු අංකය	මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තුව	පිටු අංකය
1.	මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය	3
2.	ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව	4-6
3.	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව	7-14
4.	ශ්‍රී ලංකා රේගුව	15-17
5.	ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව	18-33
6.	රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව	34-35
7.	නීති කටයුතු දෙපාර්තමේන්තුව	36-37
8.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව	38
9.	ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව	39
10.	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව	40-41
11.	ජාතික අයවැය දෙපාර්තමේන්තුව	42-46
12.	කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව	47-48
13.	රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව	49
14.	කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය	50
15.	සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව	51
16.	ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව	52
17.	විදේශ සම්පත් දෙපාර්තමේන්තුව	53
18.	ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව	54
19.	රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව	55
20.	වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව	56

දෙපාර්තමේන්තුවේ නම : මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 79

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

පළමු කොටස

කමිටුව විසින් හඳුනා ගෙන ඇති අඩුපාඩු	අදාළ අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග
අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන නොතිබීම.	2022 වර්ෂය සඳහා අවදානම් ලේඛනය සකස් කර ඇත.
සමාලෝචිත වර්ෂය තුල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නිසි පරිදි පවත්වා නොතිබීම.	මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් දෙවන කාර්තුව වෙනුවෙන් වූ විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සඳහා අදාළ න්‍යාය පත්‍රය සකස් කළ ද ඒ වන විට රට තුල පැවැති අර්බුදකාරී තත්වය හේතුවෙන් සැලසුම් කල පරිදි දෙවන කාර්තුවේ රැස්වීම පැවැත්වීමට නොහැකි විය. අනෙකුත් කාර්තුවලට අදාළ රැස්වීම් පහත පරිදි පවත්වා ඇත. 1 වන කාර්තුව - 2022.03.03 3 වන කාර්තුව - 2022.08.22 4 වන කාර්තුව - 2022.12.19
සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබීම.	අමාත්‍යාංශය සතු සංචිත වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර ඇත. අමාත්‍යවරුන් හා අමාත්‍යාංශයේ ඉහළ නිලධාරීන් භාවිතා කරන වාහනවල ආරක්ෂක හේතූන් මත රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොමැත.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිග ණය ශේෂ පැවතීම.	ස්ථාන මාරුවීම්, මිය ගිය, විශ්‍රාම ගිය හා වැඩ තහනම් කල වසරකට වැඩි නිලධාරීන් 26 දෙනෙකුගෙන් අයවීමට තිබූ රු. 3,528314.00ක මුදලින් නිලධාරීන් 21 දෙනෙකුගේ ණය ශේෂවල එකතුව වූ රු. 909,403.00ක මුදලක් මේ වන විට අයකර ගැනීම හා මු.රෙ.113 අනුව කපා හැරීමට කටයුතු කර ඇත. නිලධාරීන් 09 කගේ ඉතිරි හිග ණය ශේෂ වල එකතුව වූ රු. 2,040,420.00 ක මුදල අයකර ගැනීමට කටයුතු කරමින් පවතින අතර නිලධාරීන් දෙදෙනෙකුගේ රු. 469,418.00 ක ණය ශේෂ පිළිබඳ කටයුතු කිරීමට නීති කටයුතු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.තවත් එක් නිලධාරියෙකුගේ ණය ශේෂය අයකර ගනිමින් පවති.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 79 සඳහා මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

එම්.එම්.සී.පී. මොහොට්ටිගෙදර
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන,
සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය
කොළඹ 01

දෙපාර්තමේන්තුවේ නම : ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 79

ස්ථාවර නියෝග අංක **119(4)** යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

අංකය	වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ගනු ලැබූ පියවර / වර්තමාන තත්වය
01	2022.12.13 දිනැති අංක 2022/05 දරණ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයේ 8.1 හා 8.2 ඡේද ප්‍රකාරව සිගාස් වැඩ සටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	2022.12.13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයේ 8.1 හා 8. 2 ඡේද ප්‍රකාරව සිගාස් වැඩ සටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලැබේ.
02	අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලබයි.
03	2024.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ පළමුවන මුරපදය ගණකාධිකාරී හෝ අවසරලත් මාණ්ඩලික නිලධාරියෙකු පමණක් භාවිතාකර නොතිබුණි. 2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ මුරපද තුන් මසකට වරක් වෙනස්කර නොතිබුණි.	2024.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයේ මුරපදය යෙදීම සිදු කරනු ලබයි.
04	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි. අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	මෙම දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යාලයට අමතරව ප්‍රාදේශීය කාර්යාල 108 කින් සමන්විත වේ. විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමේදී ප්‍රාදේශීය කාර්යාලවලින් පිළිතුරු ලබා ගෙන විගණනයට පිළිතුරු සපයනු ලැබේ. මේ දක්වා හැකිතාක් ඉක්මනින් විගණන විමසුම් සඳහා පිළිතුරු සපයා ඇත. නමුත් දෙපාර්තමේන්තුවේ පවතින නිලධාරී හිඟය රාජකාරී ප්‍රමාද වීමට බලපා ඇත.
05	2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 1කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ. 756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ නියමිත පරිදි සිදු කර 2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 පරිදි අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත හා ඌණතා පිළිබඳ නිර්දේශ අදාල බලධාරීන් වෙත දැනුවත් කර ඇත.
06	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි. රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි.	2022.02.22 දිනැති ලිපියට අනුව ධාවන සටහන් කොටස් වශයෙන් විගණන අංශයට ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. සුරාබදු දෙපාර්තමේන්තුවේ බොහෝ වාහන ග්‍රහණ රාජකාරී සඳහා අනුයුක්ත කරන බැවින් රාජ්‍ය අනන්‍යතාවය හෙලි නොකර සිටීමට සිදුව ඇත.

		විගණන විමසුම යොමු කරන අවස්ථාවේදී සිදු කරමින් තිබූ මු.රෙ. පරීක්ෂණ මේ වන විට සිදු කර ඇත.
07	බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනයට පිළියෙල කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනට පිළියෙල කර සහතික කර විගණනයට ඉදිරිපත් කර ඇත. මේ වන විට 2024 ජූලි බැංකු සැසඳුම් ප්‍රකාශ 2024 අගෝස්තු 09 වන දින විගණනයට ඉදිරිපත් කර ඇත.
08	නියමිත කාලයෙන් බැහැරව ප්‍රතිපාදන වෙනත් ආයතන වෙත වෙන් කර ඇත.	නියමිත කාලයෙන් බැහැරව ප්‍රතිපාදන වෙනත් ආයතන වෙත වෙන් කිරීමක් සිදු කර නොමැත.
09	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	**මිය ගිය නිලධාරීන් ගණන 06 කි.** • එක් නිලධාරියෙකු සම්බන්ධව නීතිපති වෙත යොමු කිරීමට කටයුතු කරඇත. • අනෙකුත් නිලධාරීන් සම්බන්ධයෙන් මරණ පාරිතෝෂිකයෙන් අය කර ගැනීමට කටයුතු කරමින් ඇත. **සේවයෙන් පහ කළ ,ඉල්ලා අස්වූ සේවය අතහැර ගිය නිලධාරීන් ගණන 11 කි.** • මේ වන විට නිලධාරීන් 5 දෙනෙකු නීතිපති වෙතයොමු කිරීමට කටයුතු කරමින් පවතී. • නීතිපති වෙත යොමු කර ඇති නිලධාරීන් ගණන 01 කි. • නිලධාරීන් 3 දෙනෙකු වක්‍ර ලේඛ 01/2004 අනුව ණය ශේෂ කපා හැරීම සඳහා මුදල් අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර ඇත. • ඉතිරි නිලධාරීන් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීම සඳහා ක්‍රියාත්ම වෙමින් පවතී. **විශ්‍රාම ගිය නිලධාරීන් ගණන 13 කි.** • මේ වන විට අය වීමට ඉතිරි වී ඇත්තේ නිලධාරීන් දෙදෙනෙකුගෙන් පමණි. **වැඩ තහනමට ලක් වූ නිලධාරීන් ගණන 14 කි.** • නිලධාරීන් 3 දෙනෙකු නීතිපති වෙත ඉදිරිපත් කර ඇත. • නිලධාරීන් 5 දෙනෙකු නීතිපති වෙත යොමු කිරීමට කටයුතු කරමින් පවතී. • නිලධාරීන් දෙදෙනෙකු නැවත සේවයේ පිහිටුවා ඇත. • අනෙකුත් නිලධාරීන්ගේ ණය අය වෙමින් පවතී.
10	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පත් ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර ඇත.
11	සමාලෝචිත වර්ෂය අවසානයට මුදල් පොතේ පැවති ශේෂය අදාල වක්‍රලේඛ විධි විධාන අනුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට නියමිත දිනට ප්‍රේෂණය කොට නොතිබුණි.	වර්ෂය අවසාන අග්‍රිම ශේෂය මේ වන විට වර්ෂ අවසාන වන විට භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරනු ලැබේ.
12	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	තත්කාර්ය අතුරු අග්‍රිම මාසයක් ඇතුළත නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.
13	අක් මුදල් සැසඳුම් ප්‍රකාශය අනුව අනාවරණය වී තිබුණු වෙනස්කම් හඳුනා ගෙන ඒවා නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි.	අක් මුදල් සැසඳුම් ප්‍රකාශයේ වෙනස්කම් මාසිකව හඳුනා ගෙන නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.
14	රැස් කළ ආදායම් අදාළ විධි විධානවලට අනුකූලව ආපසු ගෙවා නොතිබුණි. රැස් කර තිබූ ආදායම්, සෘජුවම ආදායමට බැර කර හෝ ඒවා තැන්පත් ගිණුමේ රඳවා ගෙන	රැස් කරන ආදායම් නිසි පරිදි ගිණුම් ගත කරනු ලැබේ.

	මාසයකට වඩා අඩු කාලයක් ඇතුළත ආදායම් ගිණුමට බැර කර හෝ නොතිබුණි.	
15	ආයතනයට ලැබී තිබුණු විදේශාධාර සම්බන්ධයෙන් 1994.04. 20 දිනැති අංක 30/94 දරණ රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛයේ විධි විධාන ප්‍රකාරව අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. විදේශ ප්‍රධාන ලෙස ලැබී තිබුණු සියලු මුදල් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ නිල බැංකු ගිණුම වෙත ප්‍රේෂණය කර නොතිබුණි.	2022 වර්ෂයේ විදේශ ප්‍රධාන කිසිවක් මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබී නොමැත.
	දෙවැනි කොටස	
16	ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත්වන පැමිණිලි ලේඛනගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියා මාර්ග පැහැදිලි කරන ලේඛන පවත්වා නොතිබුණි.	මහජනයා විසින් සුරාබදු දෙපාර්තමේන්තුවේ 1913 මෙහෙයුම් මැදිරිය වෙත ඉදිරිපත් කරනු ලබන පැමිණිලි සියල්ල නොපමාව ecms.cxcise.gov.lk පද්ධතිය වෙත ඇතුළත්කර ඒ මොහොතේම පිළිවෙලින් අදාල සහකාර සුරාබදු කොමසාරිස්, සුරාබදු අධිකාරී හා සුරාබදු ස්ථානාධිපතිවරුන් වෙත පද්ධතිය හරහා යොමු කරන අතර පැමිණිලිවලට අදාල අන්තර්ජාලගත දත්ත පද්ධතියක් පවත්වාගෙන යනු ලබයි. එමගින් මහජනතාව ඉල්ලා සිටින තොරතුරු දිවයිනේ ඕනෑම සුරාබදු ස්ථානයක සිට ලබා දීමේ හැකියාවක් පවතී. තවද **අවශ්‍ය** වුවහොත් සියලු පැමිණිළිවලට අදාල තොරතුරු ලේඛනගත කර ගොනු සකස් කිරීමේ හැකියාවක්ද ඇත.
17	2018.01. 24 දිනැති අංක 05/2018 (1) දරන චක්‍ර ලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍ර ලේඛය ප්‍රකාරව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. ආයතනයේ පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රම වේදයක් සකස් කර නොතිබුණි.	2024 වර්ෂයේ සිට චක්‍ර ලේඛයේ උපදෙස් පරිදි පුරවැසි සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත.
18	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර ඇත.
19	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි.	කාර්ය සාධන ගිවිසුම් සකස් කර ඇත.
20	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2021 හා 2022 වර්ෂවල රට තුළ පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් සැලසුම්කර තිබූ පුහුණු කිරීම් සිදු කිරීමට නොහැකි විය. නමුත් 2023 හා 2024 වර්ෂවල සැලසුම් කළ පරිදි සේවක මණ්ඩල පුහුණු කිරීම් සිදු කර ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 79 සඳහා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

සුරාබදු කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

යූ.ඩී.එන්. ජයවීර
සුරාබදු කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක. 353, කෝට්ටේ පාර, රාජගිරිය

දෙපාර්තමේන්තුවේ නම : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 79

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

	වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ගනු ලැබූ පියවර / වර්තමාන තත්ත්වය
01	2022.12.13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයේ 8.1 හා 8.2 ඡේද ප්‍රකාරව සිගාස් වැඩසටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	2022 වර්ෂයේ දී අංක 2022/05 දරණ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු මාර්ගෝපදේශයේ අංක 8.1 හා 8.2 අනුව සිගාස් වැඩසටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලබයි.
02	හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලබයි.
03	අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	අවදානම් ලේඛණයක් සකස් කිරීම සඳහා කටයුතු කරමින් පවතී.
04	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	විගණකාධිපති විගණන විමසුම් සඳහා නියමිත දිනට පිළිතුරු සැපයීමට උපරිම උත්සහ දරනු ලැබේ. කෙසේ වෙතත්, පහත සඳහන් හේතූන් මත සමහර අවස්ථාවන් වලදී නියමිත දිනට පිළිතුරු සැපයීමේ ප්‍රමාදයන් සිදුවිය හැක. • COVID වසංගතය නිසා රජයේ කාර්යාල වෙත නිලධරයන් කැඳවීම සීමා කර තිබීම. • මාස 06 ක කාළසීමාවේ අවසන් මාස කිහිපයේදී අවම කාර්යය මණ්ඩලයක් සමඟ විශාල ආදායම් ඉලක්ක සම්පූර්ණ කිරීමට ප්‍රමුඛතාවය ලබා දීම(අනුමත කාර්යය මණ්ඩලයෙන් 1/3ක පමණ ප්‍රමාණයක් පුරප්පාඩුව තිබියදී). • ඊට අමතරව, සම්පූර්ණ කළ යුතු වෙනත් දිරිදීමනා ඉලක්ක(බදු ලියාපදිංචි කිරීම ආදිය) සම්බන්ධ කටයුතු සඳහා සැලකිය යුතු කාලයක් වැය වීම. • කාර්යය මණ්ඩලය වෙනුවෙන් වරින්වර පවත්වන පුහුණු සැසි සඳහා කාලය වැය වීම. • එකම අංශයකට විශාල විගණන විමසුම් ප්‍රමාණයක් ලැබීම නිසා සියල්ලට නියමිත දිනට පිළිතුරු දීමට අපහසු වීම. උදා:- RAMIS
05	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා නියමිත දිනට පිළිතුරු සැපයීමට උපරිම උත්සහ දරනු ලැබේ. කෙසේ වෙතත්, පහත සඳහන් හේතූන් මත සමහර අවස්ථාවන් වලදී නියමිත දිනට පිළිතුරු සැපයීමේ ප්‍රමාදයන් සිදුවිය හැක. • COVID වසංගතය නිසා රජයේ කාර්යාල වෙත නිලධරයන් කැඳවීම සීමා කර තිබීම. • මාස 06 ක කාළසීමාවේ අවසන් මාස කිහිපයේදී අවම කාර්යය මණ්ඩලයක් සමඟ විශාල ආදායම් ඉලක්ක සම්පූර්ණ කිරීමට ප්‍රමුඛතාවය ලබා දීම(අනුමත

		කාර්යය මණ්ඩලයෙන් 1/3ක පමණ ප්‍රමාණයක් පුරප්පාඩුව තිබියදී). • ඊට අමතරව, සම්පූර්ණ කළ යුතු වෙනත් දිරිදීමනා ඉලක්ක (බදු ලියාපදිංචි කිරීම ආදිය) සම්බන්ධ කටයුතු සඳහා සැලකිය යුතු කාලයක් වැය වීම. • කාර්යය මණ්ඩලය වෙනුවෙන් වරින්වර පවත්වන පුහුණු සැසි සඳහා කාලය වැය වීම.
06	සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 16/2022 සහ ඊට පසුව නිකුත් වූ චක්‍රලේඛ වලට අනුව, රජයේ කාර්යාල වෙත නිලධරයන් කැඳවීම සීමා කර තිබීම නිසා 2022 වර්ෂයේ පැවැත්වීමට නියමිතව තිබූ විගණන කළමණාකරන කමිටු රැස්වීම් 04 න් දෙවන කාර්තුවට අදාල විගණන කළමණාකරන කමිටු රැස්වීම් පැවැත්වීමට නොහැකි වූ බව කාරුණිකව සඳහන් කරමි.
07	2017.06.26 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	කාර්තුවක් පාසා මිලදී ගන්නා ලද හා අපහරණය කරන ලද වත්කම් පිළිබඳ තොරතුරු වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 අනුව කොම්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබයි.
08	2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ. 756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණ සිදු කර අදාළ වාර්තා විගණන අංශ වෙත 2023.05.11 දින වන විට ඉදිරිපත් කර ඇත. භාණ්ඩ අපහරණ වාර්තා 2023.11.11 දිනැතිව ඉදිරිපත් කර ඇත.
09	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණ වාර්තා මඟින් හඳුනා ගත් අතිරික්තතා හා ඌනතාවලට අදාළව අංශ කිහිපයක ගැලපීම් සිදු කර ඇති අතර, අනෙකුත් අංශ සඳහා හඳුනාගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී. තවද, මූල්‍ය නොවන වත්කම් කළමනාකරණයට අදාළ සියළු චක්‍රලේඛවල සඳහන් උපදෙස් අනුව විධිමත් පරිදි එක් එක් අංශවල වට්ටෝරු භාණ්ඩ ලේඛන පවත්වා ගෙන යන ලෙස දැනුවත් කිරීම් සිදු කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් අධීක්ෂණයක් කිරීමට ද කටයුතු යොදා ඇත.
10	සියලු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	විමර්ශන රාජකාරී සඳහා මෙම වාහන යොදා ගන්නා බැවින් රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීම සිදුකර නොමැත.
11	වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	**අපහරණය කළ යුතු වාහන හඳුනා ගැනීම සඳහා වන විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇති අතර,** අදාළ නිර්දේශ ඇතුළත් වාර්තාව ලද පසු අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය.
12	රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි.	මු.රෙ.ප්‍රකාරව පරීක්ෂණ මණ්ඩල පත්කර එම කටයුතු සිදු කිරීමට කටයුතු කර ඇත.
13	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	අය කර ගැනීමට නොහැකි හිඟ ණය ශේෂ සඳහා රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2024 අනුව ක්‍රියා කිරීමටත්, අනෙක් ණය ශේෂ නොපමාව අය කර ගැනීමටත් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

14	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	පොදු තැන්පත් ගිණුමේ 2022.02.28 දින වන විට කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මේ වන විට මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර ඇත. මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන හා වත්කම් කළමනාකරණ අංශයට අයත් 2022 වර්ෂයේ මාර්තු 29 දින තැන්පත් කරන ලද රු.5000/= ක මුදල නිරවුල් කිරීමට අදාල ආයතනය වෙත අවශ්‍ය ලේඛන ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත.
15	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	අතුරු අග්‍රිම නිකුත් කල දින සිට දින 10 කට නොඅඩු කාලයක් තුළ අග්‍රිම පියවා ගැනීමට කටයුතු කර ඇත.
16	මු.රෙ. 371 හි වන සීමාව ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.	මු.රෙ.371 හි වන සීමාව තුළ තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීමට කටයුතු කර ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය :- 79

ආයතනයේ නම :- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

දෙවැනි කොටස :- 76.00

	වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	**ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ගනු ලැබූ පියවර / වර්තමාන තත්ත්වය**
01	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018(I) අනුව "වාර්ෂික කාර්ය සාධන ගිවිසුම්" අත්සන් කිරීම තවදුරටත් අවශ්‍ය නොවේ. අදාල චක්‍රලේඛයේ පිටපතක් අමුණා ඇත.(ඇමුණුම - 01)
02	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	100% සම්පූර්ණ කර ඇත.
03	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අභිතකර මට්ටමේ විය.	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය සම්බන්ධයෙන් අදාළවන "විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව - 2022 - 1.6.1 හා 1.6.2" කරුණු සම්බන්ධයෙන් මේ වනවිට පහත ක්‍රියාමාර්ග ගෙන ඇත. 1.6.1.1 & 1.6.1.2 ආදායම් පාලනයට සම්බන්ධව එක් එක් බදු වර්ගයට අදාළව බදු ගෙවන්නන් විසින් ගෙවන ලද බදු ආදායම, ආදායම් කාණ්ඩ අනුව වෙන් කිරීම සහ මහා භාණ්ඩාගාරය වෙත යවන ආදායම (භාණ්ඩාගාරයෙන් ලද බව සනාථ කරන ආදායම) සහ දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අනුව දෙපාර්තමේන්තුවට ලැබූ ආදායම සැසඳීමේදී ඉහත කාණ්ඩ දෙක අතර වෙනස්කම් පවතී. මෙසේ වෙනසක් ඇතිවීමට පහත හේතූන් බලපාන බව නිරීක්ෂණය වේ. • OTTPයටතේ මාසයේ අවසාන දින ප. ව. 3.00 ට පසු සිදු කරන ගෙවීමක් ඊට පසු මාසයේ පළමු දින භාණ්ඩාගාරය වෙත මාරුවීම හා දෙපාර්තමේන්තු සටහන්වල ගෙවූ දිනට අදාළව සටහන් වීම. • බැංකු වෙතින් සිදුවන වැරදීම්වලදී (Bank Error) සමහර ගෙවීම් සම්බන්ධව නිරවුල් කිරීමට කල්ගත වීම. • වෙක් අගරුවීම් සිදුවීම නිසා. 1.6.1.3
04	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	

		පාලන ගිණුමේ ඉතිරි වී ඇති ශේෂය විවිධ බදු වර්ග වලට අදාල පොදු වටිනාකමක් බව පෙනී යයි. එක් එක් බදු වර්ග වලට අදාල ශුද්ධ වටිනාකම හඳුනා ගැනීමට අපහසු බැවින් පොදු වටිනාකමක් ලෙස දක්වන අතර, එම ශේෂය තුල එකතු කල අගය මත බද්දට අදාල කොටසක්ද පැවතිය හැකිය. බදු ගෙවීමේදි බදු ගෙවන්නා ගෙවීම සිදු කරන්නේ එකතු කල අගය මත බදු ලෙස (000000000-7000) වන බැවින් එම බද්ද මූල්‍ය සේවා, නිෂ්පාදන හෝ අනෙකුත් සේවා ලෙස වෙන්කල නොහැක. එසේ වුවද ඊළඟ මාසයේදී එම ශේෂයට අදාල ගෙවීම අදාල TIN වෙත බැරවූ විට නිවැරදි ආදායම් සංකේතයට වෙන් වනවා ඇත. මෙය දිගින් දිගටම පවතින ක්‍රියාවලියක් බැවින් යම් දිනකට මෙම ශේෂය ශූන්‍ය කර පෙන්විය නොහැකිය. 1.6.2 මූල්‍ය නොවන වත්කම් • නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලය පිහිටි ඉඩම තක්සේරු කර ගිණුම්ගත කර ඇත. කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය පිහිටි ඉඩම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සතුව හිමිකම් ඔප්පුවක් නොමැත. නමුත් මේ වන විට මායිම් ඉඩම්වල ඔප්පු මගින් මෙහි අයිතිය තහවුරු කර ගැනීම සඳහා කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලයේ කොමසාරිස් කටයුතු කරමින් පවතී. මෙහි අයිතිය තහවුරු කර ගැනීමෙන් පසුව තක්සේරු වාර්තාවක් ලබාගෙන ඉදිරි කටයුතු සිදු කිරීමට අපේක්ෂිතය. • 2021.12.31 දිනට පැවති වත්කම් ඉවත් කොට 2022 වර්ෂයේදී CIGAS වැඩසටහනට සියළු වත්කම් නැවත ගිණුම් ගත කිරීම සිදු කෙරුණි. මෙම වාහන 05, 2022 වර්ෂයේ පොලිස් දෙපාර්තමේන්තුවට පවරා ඇතත් එය 2021 පැවරීමක් ලෙස සලකා නැවත වත්කම් ඇතුලත් කිරීමේදී ප්‍රමාද දෝෂයකින් එම අගය ඉවත් කර ආරම්භක ශේෂය ඇතුලත් කර ඇත. නමුත්, 2022.12.31 දිනට වාහන වල අගය නිවැරදිව 246,787,150/= ලෙස සටහන් වී ඇත. වර්ෂය තුල අපහරණ (disposal) ලෙස ඇතුලත් වී නොමැති නමුත් ආරම්භක ශේෂයෙන් එම අගය ඉවත් වී ඌණ ගණනය වී ඇත. නමුත් අවසාන ශේෂය නිවැරදිය.
05	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ / නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.	• RAMIS ව්‍යාපෘතිය යටතේ දැනට සම්බන්ධ කර ඇති ආයතන සංඛ්‍යාව 08 ක් වන අතර, එය පහත පරිදි දැක්වේ. 1. ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව 2. සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව 3. ලංකා බැංකුව 4. මුදල් අමාත්‍යාංශය 5. ලංකා ක්ලියර් පුද්ගලික සමාගම 6. මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව 7. මහජන බැංකුව RAMIS ව්‍යාපෘතිය යටතේ සම්බන්ධ කිරීමට කටයුතු කරමින් පවතින ආයතන 05 කී. ඒවා නම්, 1. බැංකු 2. මූල්‍ය ආයතන 3. කොටස් වෙළඳපොල 4. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

		5. ආගමන විගමන දෙපාර්තමේන්තුව 6. සුරාබදු දෙපාර්තමේන්තුව • අගරු වෙක්පත් සම්බන්ධයෙන් අංක 2378/33 හා 2024.04.04 දිනැති ගැසට් පත්‍රය යටතේ ආදායම් බදු සඳහා වෙක්පත් භාර ගැනීම නවත්වා ඇත. (ඇමුණුම - 02)
06	නිලධාරීන්ගෙන් රජයට සිදු වූ පාඩු වෙනුවෙන් මු.රෙ. 156(1) ප්‍රකාරව අය කිරීම් කර නොතිබුණි.	අදාළ කාල සීමාව තුළ දී කරන ලද පරීක්ෂණ වලදී 156 (1) යටතේ කටයුතු කිරීමේ සීමාව ඉක්මවූ සිදුවීම් වාර්තා වී නොමැත.
07	මු.රෙ. 119 ප්‍රකාරව අය කළ යුතු අධිභාර අයකර නොතිබුණි.	අධිභාර අයකර ගැනීමට අදාළ සීමාව ඉක්මවූ සිද්ධීන් වාර්තා වී නොමැත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 79 සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

කොමසාරිස් ජනරාල්
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

ඩබ්.ඒ. සේපාලිකා චන්ද්‍රසේකර
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
සර් විත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත
කොළඹ-02.

අමාත්‍යාංශ චක්‍රලේඛ - 01

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 02/2018 (I)

මගේ අංකය : MPA/HRD/ADMIN/Circular/01/2023

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2023.11.30

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන වල සභාපතිවරුන්

<u>රාජ්‍ය අංශය තුළ මානව සම්පත් සංවර්ධනය කිරීම</u>

උක්ත මැයෙන් 2018.01.24 දිනැතිව නිකුත් කරන ලද අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අමතර වශයෙනි.

02. අංක 2289/43 හා 2022/07/22 දිනැතිව ප්‍රකාශයට පත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍රය මඟින් රාජ්‍ය සේවා පුනුරුත්ථාපන සම්බන්ධ කාර්යභාරය මෙම අමාත්‍යාංශයේ විෂය පථයට ඇතුලත් කර ඇත. ඒ අනුව, මහජනතාව වෙත උසස් සේවාවක් සැපයීමේ අරමුණින් සියලු රාජ්‍ය සේවාවන්හි පූර්ණ ධාරිතා සංවර්ධනයක් ඇති කිරීම සඳහා විශේෂ අවධානයක් යොමුකිරීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා ජනතා කේන්ද්‍රීය රාජ්‍ය සේවයක් සැපයීමත්, රාජ්‍ය සේවයේ ඵලදායීතාවය හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීමත් යන අරමුණු පෙරදැරිව වෘත්තීය සංවර්ධනය ද ඇතුළත්ව සියළු රාජ්‍ය ආයතනයන්හි දීර්ඝ කාලීන මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීමේ අවශ්‍යතාවයත්, එහි වැදගත්කම හා එවැනි සැලැස්මක ඇති ඵලප්‍රයෝජන පිළිබඳවත් නැවත අවධානය යොමුකරමි.

03. රාජ්‍ය සේවයේ සියළුම මාණ්ඩලික හා මාණ්ඩලික නොවන නිලධාරීන්ගේ කාර්ය සාධන ඇගයීම සම්බන්ධව පිළිවෙලින් 1998/03/13, 1998/04/30 හා 1998/12/11 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/98, 08/98 (i) හා 08/98 (ii) මඟින් හඳුන්වා දී ඇති කාර්යය සාධන ඇගයීම සඳහා භාවිතා කළ යුතු ආකෘති පත්‍ර තවදුරටත් අර්ථපූර්ණ ලෙස යොදාගන්නා ලෙස මින් අවධාරණය කරනු ලැබේ. ඒ අනුව, උක්ත කාර්ය සාධන ඇගයීම වාර්ථා මඟින් නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනා ගෙන, එම අවශ්‍යතා සපුරාලීම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා එමඟින් ඔවුන්ගේ කාර්යය සාධනය ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ. ඒ සඳහා ඔබගේ ආයතනය තුළ මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට මෙමඟින් මග පෙන්වනු ලබන අතර ඒ වෙනුවෙන් සකස් කරන ලද මාර්ගෝපදේශය මෙහි උපලේඛනය මඟින් දක්වා ඇත. ඒ අනුව, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 හි (1) ඡේදය මින් සංශෝධනය කරනු ලබන අතර ඒ අනුව එම චක්‍රලේඛයේ සඳහන් පරිදි "වාර්ෂික කාර්ය සාධන ගිවිසුම්" අත්සන් කිරීම තවදුරටත් අවශ්‍ය නොවේ.

04. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 හි ඡේද අංක 02 සිට 06 දක්වා වූ කරුණු තව දුරටත් වලංගු වන අතර එම කරුණු වඩාත් තහවුරු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් මෙහි උපලේඛනයේ ඇතුලත් මාර්ගෝපදේශය මඟින් ලබාදෙනු ලැබේ. ඒ අනුව, ඔබ ආයතනයට අදාළ මානව සම්පත් සංවර්ධන සැලැස්ම සැකසීමේදී ඒ සඳහා උපයෝගී කරගත හැකිවන පරිදි එහි මෘදු පිටපත මෙම අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි මානව සම්පත් සංවර්ධන අංශයේ වෙබ් පිටුවෙහි පළකර ඇත. මේ සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලිකර ගැනීම අවශ්‍ය නම් දුරකථන අංක 011 2694041 මඟින් මෙම අමාත්‍යාංශයේ මානව සම්පත් සංවර්ධන අංශය සම්බන්ධ කරගත හැකි බවද සඳහන් කරමි.

කේ.ඩී.එන්. රංජිත් අශෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන
අමාත්‍යාංශය

පිටපත් :

01. ජනාධිපති ලේකම් - කරු අ.කා.ස.
02. අග්‍රාමාත්‍ය ලේකම් - කරු අ.කා.ස.
03. අමාත්‍ය මණ්ඩල ලේකම් - කරු අ.කා.ස.
04. විගණකාධිපති - කරු අ.කා.ස.

ඇමුණුම - 02

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

EXTRAORDINARY

අංක 2378/33 - 2024 අප්‍රේල් මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2024.04.04

No. 2378/33 - THURSDAY, APRIL 04, 2024

(Published by Authority)

PART I : SECTION (I) — GENERAL

Government Notifications

INLAND REVENUE ACT, No. 24 OF 2017

Notice under Subsection (3) of Section 145

BY virtue of the powers vested in me by Subsection (3) of Section 145 of the Inland Revenue Act, No.24 of 2017, I, Wijesingha Arachchige Sepalika Chandrasekara, Commissioner General of Inland Revenue, do by this notification, specify the manner of tax payments in Schedule I hereto.

WIJESINGHA ARACHCHIGE SEPALIKA CHANDRASEKARA,
Commissioner General of Inland Revenue.

Inland Revenue Department,
Colombo 2,
April 1, 2024.

SCHEDULE 1

MANNER OF TAX PAYMENTS

Tax payments shall be made to the Commissioner General, only by the use of following methods:-

(a) By depositing cash;

(b) By depositing pay order or bank draft;

(c) By the use of Online Tax Payments Platform (OTPP).

EOG 04 - 0035

1A - G 41712 - 05 (04/2024) PRINTED AT THE DEPARTMENT OF GOVERNMENT PRINTING, SRI LANKA.

This Gazette Extraordinary can be downloaded from www.documents.gov.lk

දෙපාර්තමේන්තුවේ නම : ශ්‍රී ලංකා රේගුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 79

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

	වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනා ගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදිකරගැනීම සඳහා ගනු ලැබූ පියවර/වර්තමාන තත්ත්වය.
පළමු කොටස: 83.00		
1	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුල පිළිතුරු සැපයීමට උපරිම උත්සාහ දරණ අතර සමහර ගොනු සොයා ගැනීමට ගතවන කාලය අනුව යම් ප්‍රමාදයන් සිදුවන නමුත් ඉදිරියේදී එවැනි තත්ත්වයන් ඇති නොවීමට අවශ්‍ය පියවර ගෙන ඇත.
2	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	මේ සඳහා අදාළ අංශ දැනුවත් කර ඇති අතර ඉදිරියේදී මෙවන් තත්ත්වයන් ඇති නොවීමට ක්‍රියා කරනු ඇත.
3	සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබිණි.	2022 වර්ෂය තුල පැවති අයහපත් ආර්ථික තත්ත්වයන් හා ඉන්ධන අර්බුදය හේතුවෙන් නිලධාරීන්ගේ සේවයට පැමිණීම සීමා වීම සහ ප්‍රවාහන අපහසුතා හේතුවෙන් නියමිත පරිදි රැස්වීම් පැවැත්වීමට නොහැකි වූ අතර 2023 වර්ෂයේ නියමිත පරිදි රැස්වීම් පවත්වා ඇත.
4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානුව තුල ක්‍රියාත්මක කර නොතිබුණි.	2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල මගින් අනාවරණය වූ ඌනතා -අතිරික්තතා සම්බන්ධයෙන් නියමිත පරිදි කටයුතු අදාල අංශ වලට දැනුම් දී ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට අපේක්ෂිතවේ. එසේම පොදු 47 හි සඳහන් භාණ්ඩ අපහරණය කිරීම සඳහා කමිටුවක් පත්කර දැනට කටයුතු කරමින් පවතී. එම කටයුතු කඩිනමින් නිමකර විගණකාධිපති වෙත හා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත දැණුම් දීමට අපේක්ෂිතය.
5	සියලු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	රේගු වැටලීම් සිදුකිරීමේදී රේගුව සතු වාහනවල රාජ්‍ය ලාංඡනය හෝ රේගු ලාංඡනය ප්‍රදර්ශනය කර තිබීම එම වැටලීම් රහසිගතව සිදුකිරීමට බාධාවක් විය හැකි බැවින් එම ලාංඡන ප්‍රදර්ශනය කිරීම ප්‍රායෝගිකව සුදුසු නොවන අතර, සාමාන්‍ය රාජකාරී ගමන් අවස්ථාවලදී රාජ්‍ය ලාංඡනය හා රේගු ලාංඡනය තාවකාලිකව ප්‍රදර්ශනය කරනු ලබයි.
6	වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 මගින් සංශෝධිත මූ.රෙ. 770(4) අනුව අපහරණය කළ යුතු වාහන හඳුනාගැනීම සඳහා විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් පත්කර අපහරණය කළ යුතු වාහන 04ක් හඳුනාගෙන ඇත. ඒ අනුව තක්සේරු මණ්ඩල හා අපහරණ මණ්ඩල පත්කර ඉදිරි කටයුතු කිරීමට පියවර ගනිමින් පවති.

	වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනා ගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදිකරගැනීම සඳහා ගනු ලැබූ පියවර/වර්තමාන තත්ත්වය.
7	රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි.	පරීක්ෂණ සඳහා පත්කරනු ලබන නිලධාරීන්ගේ කාර්ය බහුලත්වය මත අදාල පරීක්ෂණ වාර්තා නියමිත කාලයට ලබා දීමට ප්‍රමාද වීම හේතුවෙන් මු.රෙ.(104) අවසන් වාර්තා නියමිත කාලය තුල අවසන් කිරීමට නොහැකි වී ඇත. ඉදිරියේදී අදාල පරීක්ෂණ නියමිත කාලය තුල සිදුකිරීමටත් දැනට පවතින පරීක්ෂණ කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරමි.
8	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	2024.05.29 දිනැති රාජය මුදල් වක්‍රලේඛ 01/2024 අනුව හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරමින් පවතී.
9	මු.රෙ. 371 ප්‍රකාරව තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුලත නිරවුල් කර නොතිබුණි.	තත්ත්කාර්ය අතුරු අග්‍රිම ලබා ගත් කාර්යය නිම වූ වහාම නිරවුල් කිරීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කර ඇත.
10	මු.රෙ.371 හි වන සීමාව ඉක්මවා තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.	මාගේ අනුමැතිය යටතේ ලබා ගත හැකි සීමාව ඉක්මවන අවස්ථාවලදී භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන අතුරු අග්‍රිම නිකුත් කිරීමට පියවර ගෙන ඇත.
දෙවැනි කොටස: 73.00		
1	ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි	2023 වර්ෂය වනවිට ශ්‍රී ලංකා රේගුව විසින් 2024-2028 වර්ෂයන් ඉලක්ක කරගත් උපාය මාර්ගික සැලැස්මක් සකස්කර ඊට අදාල ඉලක්කයන් වෙත ලඟාවීම සඳහා කටයුතු සිදුකරමින් පවතී. එම ප්‍රධාන ඉලක්කයන්ට අනුරූප පහත සඳහන් තිරසාර සංවර්ධන අරමුණු මේ වනවිටත් හඳුනාගෙන ඇත. 1. රාජ්‍ය ආදායම නියමිත පරිදි එකතු කිරීම. 2. ජාත්‍යන්තර වෙළඳාම සඳහා පහසුකම් සැළසීම. 3. රේගු නීතිය හා අදාල අනෙකුත් නීති ක්‍රියාත්මක කිරීම සහ වංචාවන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම. 4. සමාජීය, පාරිසරික සහ ජාතික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම.
2	හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීම සඳහා ළඟා කර ගත යුතු ඉලක්ක තීරණය කර නොතිබුණි.	ඉහත 1 හි සඳහන් තිරසාර සංවර්ධන අරමුණු හා සම්බන්ධිත ආයතනික ප්‍රධාන ඉලක්කයන් ලඟාකර ගැනීම සඳහා හඳුනාගනු ලැබූ අරමුණු, උපායමාර්ග සහ ක්‍රියාකාරකම් උප මාතෘකා යටතේ බෙදා වෙන්කර ඇත. එකී අරමුණු මත පදනම්ව ඉලක්ක ළඟාකර ගැනීම පිණිස ක්‍රියාකාරී සැලැස්ම සහ කාර්ය සාධන සැලැස්ම සකස් කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ අදාල අංශ වලට යොමුකර ඇති අතර එම කාර්යසාධනයන් අර්ධ වාර්ෂිකව සහ වාර්ෂිකව ඇගයීමට ලක්කිරීමට කටයුතු යොදා ඇත.
3	හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි	ආයතනයට අදාල තිරසර සංවර්ධන ඉලක්ක ලඟාකර ගැනීමට අදාල ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුනා ගෙන ඇත.
4	2018.01.24 දිනැති අංක 05/2018(1) වක්‍ර ලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති	රේගුවේ කාර්යභාරය ජාත්‍යන්තර වෙළඳාම සමඟ සෘජුවම සම්බන්ධ වී ඇති අතර ජාත්‍යන්තර

	වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනා ගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදිකරගැනීම සඳහා ගනු ලැබූ පියවර/වර්තමාන තත්ත්වය.
	අංක 05/2008 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ප්‍රකාරව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි	ප්‍රඥප්තීන්ට සහ ජාත්‍යන්තර ගිවිසුම් වලට අනුකූලව එම කටයුතු සිදුකළ යුතුවේ. කියොතෝ ප්‍රඥප්තිය සහ ලෝක වෙළඳ සංවිධානය සමඟ අත්සන් කරන ලද වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ ගිවිසුම (WTO-TFA) මේ සඳහා උදාහරණ කීපයකි. ඒ අනුව, සේවා සැපයුම පිළිබඳ සකස් කරන ලද ප්‍රඥප්ති සෑම විටම ජාත්‍යන්තර ගිවිසුම් සහ ප්‍රඥප්තීන්හි අන්තර්ගතයන්ට අනුකූල විය යුතුය. ශ්‍රී ලංකා රේගුව මේ වන විට රේගුවේ කාර්යයන්ට අදාලව සේවාලාභීන් සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියාවලිය (SOP) හඳුනාගෙන ඇති අතර ඉන් සමහරක් ප්‍රකාශයට පත්කර ඇත. තවද, ආනයන භාණ්ඩ නිදහස් කිරීමට ගතවන කාලය පිළිබඳ අධ්‍යයනයක් ඉදිරියේදී සිදුකිරීමට නියමිත වී ඇති අතර, එමගින් මහජනයාගේ දැනගැනීම සඳහා දෙපාර්තමේන්තු වෙබ් අඩවියට පිවිසීමෙන් සේවාලාභීන්ට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට අවස්ථාව සැලසෙනු ඇත.
5	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි	රේගු දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික මට්ටමේ සේවකයන්ගේ සිට ජ්‍යෙෂ්ඨ තනතුරු දක්වා විහිදුණු පැය 12 ඉක්මවන නිපුණතා සංවර්ධන පුහුණු වැඩසටහන් සහ විශේෂ ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි දේශීය පුහුණු පාඨමාලා මෙම අංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව මේ වන විටත් පවත්වනු ලබයි. මීට අමතරව ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු හොබවන අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල්වරුන් විශේෂ ක්ෂේත්‍රයන් යටතේ සංවිධානය වන දේශීය හා විදේශීය සම්මන්ත්‍රණ හා වැඩමුළු සඳහා සහභාගි වේ.
6	සමස්ත කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගත වී නොතිබුණි	සියලුම නිලධාරීන්ගේ කාර්ය සාධන ඇගයීමක් සිදු කරන අතර ඉදිරියේදී අවශ්‍ය දැනුවත් කිරීම් සිදු කර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 අනුව කටයුතු කිරීමට අපේක්ෂා කරමි.
7	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය තත්ත්වාගණනය කළ මට්ටමේ විය.	ශ්‍රී ලංකා රේගුවේ 2022 හා 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය පිළිබඳව 2018 අංක 19 දරණ විගණන පනතේ 11/(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවල තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ලෙස යොදා ගෙන ඇති කරුණු සම්බන්ධයෙන් නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරමින් පවතී.
8	සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	නිසි පරිදි දැනුවත් කර, අදාළ සියලු නිලධාරීන්ගෙන් වත්කම් බැරකම් ප්‍රකාශ ලබා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 79 සඳහා ශ්‍රී ලංකා රේගුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

රේගු අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා රේගුව

පී.බී.එස්.සී. නෝනිස්
රේගු අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා රේගුව
"රේගු මන්දිරය"
අංක 40, කෙල්ලිස් පිඳිය, කොළඹ 11

දෙපාර්තමේන්තුවේ නම : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 79

ස්ථාවර නියෝග අංක **119(4)** යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

පළමු කොටස : **92.00**

අනු අංකය	වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ගනුලැබූ පියවර / වර්තමාන තත්වය
01	2017.06.26 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබීම.	2018 වර්ෂයේ මිලදී ගැනීම් සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කරන ලෙසට උපදෙස් ලබාදී ඇති අතර 2023 වර්ෂයේ මිලදී ගත් භාණ්ඩ පරිගණක ගත කර ඇත.
02	2017.06.26 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේකයේ 13 ඡේදය ප්‍රකාරව චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියෙකු පත්කර කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත දන්වා නොතිබීම.	01/2017 දරන වත්කම් නළමනාකරණ චක්‍රලේඛයේ 13 ඡේදය ප්‍රකාරව චක්‍රලේඛ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට සම්බන්ධීකරණ නිලධාරියෙකු ලෙස ගණකාධිකාරී එස්.ඒ.ආර් සම්පත් මයා නම් කර ලිපියකින් කොම්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය දැනුවත් කර ඇත.
03	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානුව තුල ක්‍රියාත්මක කර නොතිබීම.	අතිරික්තතා ඉන්වෙන්ට්‍රිගත කිරීම සිදුකල නමුදු ඌනතා සඳහා මු.රෙ. 104 ප්‍රකාරව කටයුතු කිරීමට සිදුවිය. ඒ අනුව පත් කරන ලද කමිටුව විසින් අදාල තොරතුරු සොයා බැලීම හා ප්‍රකාශ ලබාගැනීම ආදිය සිදු කිරීමට යම් කාලසීමාවක් ගත විය. ඒ අනුව මේ වන විට කමිටුව විසින් පරීක්ෂණයට අදාලව මූලික වාර්තාව ලබාදී ඇති අතර ඒ අනුව අදාල කපාහැරීම් හා තවදුරටත් සොයා බැලීම් ආදිය සිදු කරමින් පවතී.
04	සියළු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබීම.	වාහනවල රාජ්‍ය ලාංඡන පින්තාරු කිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට අවශ්‍ය තොරතුරු ගිණුම් අංශය වෙත ඉදිරිපත් කර ඇත.
05	වාහනයක් ගර්හිත වී මාස 08 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	අංක GD-5581 සහ GD-5584 දරන වාහන වලට අදාල මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙතින් ලියාපදිංචිය අවලංගු කර පුහුණු කටයුතු වෙනුවෙන් භාවිතය සඳහා වෘත්තීය පුහුණු අධිකාරිය වෙත පවරා දී ඇත. අංක PB – 8063 දරන වාහනයට අදාලව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙතින් ලියාපදිංචිය අවලංගු කර මෙතෙක් ලැබී නොමැත. අංක PC – 2421 දරන වාහනය සම්බන්ධ පත්කරන ලද 104(4) කමිටු වාර්තාව මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති අතර එම වාර්තාව මගින් ලබාදෙන නිර්දේශ සඳහා ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.

06	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතීම.	ණය ශේෂ නිරවුල් කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වයට අදාල විස්තර ඇමුණුම 01 යටතේ දක්වා ඇත.
07	ආයතනයට ලැබී තිබුණු විදේශාධාර සම්බන්ධයෙන් 1994.04.20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් වක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබීම.	• 19,20 සහ 21 වන ජාත්‍යන්තර ශ්‍රම සංඛ්‍යාලේඛනඥවරුන්ගේ සම්මේලන වලදී ගත් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා 2024 වර්ෂයේදී සිදුකිරීමට නියමිත නියමු අධ්‍යයනයේ වියදම් ආවරණය කර ගැනීමට මෙම ප්‍රතිපාදන භාවිතා කරයි. එම කටයුතු සැලසුම් කිරීමේදී අදාළ ප්‍රශ්නාවලිය ඇතුලු උපලේඛන සකස් කිරීමේදී අන්තර්ජාතික විශේෂඥයන්ගේ සහාය දුරස්ථ මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සිදු කිරීමට අවශ්‍ය කටයුතු සකස් කිරීමේදී අවශ්‍ය උපාංග මිලදී ගෙන එම පහසුකම් දෙපාර්තමේන්තුව තුළ ඇතිකර ගැනීමට මෙම ප්‍රතිපාදනවලින් කොටසක් භාවිතා කිරීමට බලාපොරොත්තු වේ. ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා දැනටමත් අමාත්‍යාංශ ලේකම් වෙත ඉල්ලීමක් යොමු කර ඇත. නියමු සමීක්ෂණයේ ප්‍රතිඵල මත අදාල උපලේඛන යාවත්කාලීන කර එම සමීක්ෂණය ඉදිරි වසරවල සිදු කිරීමටත් එම මුදල් භාවිතා කිරීමට යෝජිත වේ. • 2019 වර්ෂයේදී පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ඉල්ලීමක් අනුව UNICEF ආධාර මත සිදු කරන ලද ළමා නිවාසගත ළමුන් පිලිබඳ සංගණනයේ ගෙවීම් සඳහා අනුමැතිය ලැබීම ප්‍රමාද වූ බැවින් එම විදේශාධාර පොදු තැන්පත් ගිණුමේ රඳවා ගැණිනි. එම ගෙවීම් සඳහා මේ වන විට අනුමැතිය ලැබී ඇති බැවින් මේ වන විට ගෙවීම සඳහා ඉදිරිපත් කෙරෙමින් පවතී.
08	විදේශ ප්‍රදාන ලෙස ලැබී තිබුණු සියළු මුදල් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ බැංකු ගිණුම වෙත ප්‍රේෂණය කර නොතිබීම.	• මෙම කටයුතු පසුගිය වසර කිහිපය තුළ සිදු කිරීමට බලාපොරොත්තු වුවත් කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ සහ රට තුළ පැණනැගුන ආර්ථික අර්බුද තත්ත්වය හමුවේ එම කටයුතු සැලසුම්කල ආකාරයට සිදු කිරීමට නොහැකි විය. ඒ අනුව 2024 වර්ෂයේදී එම මුදල් භාවිතා කර උක්ත කාර්යයන් සිදුකිරීමට මෙම මුදල් තවදුරටත් රඳවා ගැනීමට අවශ්‍ය වූ බව කාරුණිකව දන්වා සිටිමි.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය: **79**

ආයතනයේ නම: **ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.**

දෙවන කොටස : **71.00**

අනු අංකය	වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ගනුලැබූ පියවර / වර්තමාන තත්වය
01	ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබීම.	තිරසර සංවර්ධන අභිමථාර්ත සාක්ෂාත් කරගැනීමේ ක්‍රියාවලියේදී අරමුණු අංක 17 යටතේ ඇති ඉලක්ක 17.18 ළඟා කර ගැනීම සම්බන්ධ වගකීම ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සතුව ඇත. ඒ යටතේ ඇති 17.18.2 සහ 17.18.3 දර්ශක දෙපාර්තමේන්තුව මගින් හඳුනාගෙන තිබුනි. ඒ අනුව තිරසර සංවර්ධන ඉලක්ක 17.18 සපුරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබයි. මීට අමතරව තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීමේ ක්‍රියාවලියේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති මූලික කාර්යභාරය වනුයේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන සංගණන හා සමීක්ෂණ මත පදනම්ව තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම සඳහා අවශ්‍ය ඉලක්ක වෙත ලඟා වීම මැනබැලීම සඳහා අවශ්‍ය දර්ශක සම්පාදනය කර ලබා දීමයි. ඒ අනුව තිරසර සංවර්ධන අභිමථාර්ත දර්ශක 35 ක් සඳහා දත්ත සම්පාදනය කිරීමේ වගකීම දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති අතර ඒ අතුරින් වාර්ෂිකව පිලියෙල කරණු ලබන දර්ශක 12 ක් 2022 වර්ෂයේදී සකස්කිරීමේ කටයුතු සිදුකොට ඇත. 2022 වර්ෂයට අදාලව, දෙපාර්තමේන්තු කාර්යය සාධන වාර්තාවේ, 5 පරිච්ඡේදයට අදාල ඉහත සඳහන් කරුණු ඇතුළත් වී නොතිබුණ නමුත් 2023 කාර්යය සාධන වාර්තාවට එම කරුණු ඇතුළත් කිරීමට පියවර ගෙන ඇත.
02	හඳුනාගත් තිරසර අරමුණු ඉටුකර ගැනීම සඳහා ලඟාකර ගතයුතු ඉලක්ක තීරණය කර නොතිබුණි.	
03	හඳුනාගත් තිරසර අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබීම.	
04	2018.01.24 දිනැති අංක 05/2018(I) දරන වක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති වක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිලියෙල කර ක්‍රියාත්මක කර නොතිබීම.	පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය පිලියෙල කර ඇත.
05	ආයතනයේ පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිලිබඳව අධීක්ෂණය කිරීමට හෝ ඇඟයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබීම.	ආයතනයේ පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිලිබඳව අධීක්ෂණය කිරීමට හෝ ඇඟයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර ඇත.

06	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිලියෙල කර නොතිබීම.	2022 වර්ෂයේ මානව සම්පත් සැලැස්ම සකස් කිරීම අවසන් කළ නොහැකි විය. ඊට හේතු ලෙස 2022 වර්ෂයේ ශ්‍රී ලංකාවේ පැවති තත්වය හේතුකොටගෙන රා.ප.ව. 10/2022, 14/2022, 15/2022 සහ 16/2022 කෙරේ අවධානය යොමු කරමි. තවද මුදල් අමාත්‍යාංශය මඟින් 2022.04.26 දින සිට නිකුත් කළ ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 කෙරේ අවධානය යොමු කරවමි. • 15/2022 - රජයේ කාර්යාල වෙත නිලධාරීන් කැඳවීම සීමා කරන ලදී. • 10/2022 - සම්පත් හිඟය මත වියදම් අවම කර ගැනීම සඳහා රාජ්‍ය ආයතනවල කාර්ය මණ්ඩලය කැඳවීම සීමා කරන ලදී. • 04/2022 - රාජ්‍ය වියදම් කළමනාකරණය කර ගැනීම සඳහා විදුලිය හා ඉන්ධන අරපිරිමැස්මෙන් යුතුව භාවිතා කරන ලදී. • 14/2022 - රාජ්‍ය නිලධාරීන්ට දේශීය හා විදේශීය නිවාඩු ලබා ගැනීමට දිරිමත් කරන ලදී • ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 අනුව රාජ්‍ය වියදම් පාලනය කිරීම සිදු කරන ලදී. 2023 වර්ෂය වන විට අදාල සැලැස්ම අනුව පුහුණු වැඩසටහන් සිදු කරන ලදී. එසේ 2024 වර්ෂයේදී 2024.01.10 දිනැති ජාතික ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 රාජ්‍ය වියදම් පාලනය චක්‍රලේඛ අංක 05දේශීය පුහුණු වැඩසටහන් යටතේ ලබා දී ඇති උපදෙස් අනුව සහ රාජ්‍ය නිලධාරීන් බඳවා නොගැනීමට අදාලව මානව සම්පත් සැලැස්මක් පිළියෙල කිරීමට ගැටළුකාරී බවද සඳහන් කරමි. 2023 හා 2024 වර්ෂයේ අදාල සැලැස්ම ඇමුණුම 02හි ඉදිරිපත් කර ඇත.

07	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් 50% කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබීම.	2022 වර්ෂය සඳහා 2401 වැය විෂය යටතේ කාර්ය මණ්ඩල පුහුණු රු.මි. 4.5 ඉල්ලුම් කළ නමුත් වසර මුලදී රු.මි. 0.232ක් පමණක් ලැබිනි. 2022.10.04 දින නැවතත් රු.මි. 0.1 ලැබිනි. ඒ අනුව රු.මි. 0.332ක මුදලක් වැය කිරීමෙන් කාර්ය මණ්ඩලයේ සියලු සාමාජිකයන් සඳහා පැය 12 නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කළ නොහැකි විය. තවද • 15/2022 - රජයේ කාර්යාල වෙත නිලධාරීන් කැඳවීම සීමා කරන ලදී. • 10/2022 - සම්පත් හිඟය මත වියදම් අවම කර ගැනීම සඳහා රාජ්‍ය ආයතනවල කාර්ය මණ්ඩලය කැඳවීමා සීමා කරන ලදී. • 04/2022 - රාජ්‍ය වියදම් කළමනාකරණය කර ගැනීම සඳහා විදුලිය හා ඉන්ධන අරපිරිමැස්මෙන් යුතුව භාවිතා කරන ලදී. • 14/2022 - රාජ්‍ය නිලධාරීන්ට දේශීය හා විදේශීය නිවාඩු ලබා ගැනීමට දිරිමත් කරන ලදී. • ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 අනුව රාජ්‍ය වියදම් පාලනය කිරීම සිදු කරන ලදී. ඉහත චක්‍රලේඛය මඟින් ලබා දී ඇති උපදෙස් අනුව අදාල ඉලක්ක සපුරාලීමට නොහැකි වූ බව සඳහන් කරමි. එසේම ඇමුණුම 03 හි සඳහන් පුහුණු වැඩසටහන් 2022 වර්ෂයේ සිදු කර ඇති බවද වැඩි දුරටත් පෙන්වා දෙමි. 2023 වර්ෂයේ පුහුණු වැඩසටහන් 100% සිදු කර ඇති බවද පෙන්වා දෙන අතර 2024 වර්ෂය පුහුණු වැඩසටහන් මේ වන විටත් සිදු කරමින් පවතී.
08	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබීම.	කාර්ය සාධන ගිවිසුම් සකස් කර නොමැත. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 (I) අනුව 2023 වර්ෂයේ සිට වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම අවශ්‍ය නොවේ.

09	සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබාදී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතීම.	සැලසුම් කළ පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට අඩු බව සඳහන් කරමි. එයට හේතු පහතින් දැක්වේ. • 15/2022 - රජයේ කාර්යාල වෙත නිලධාරීන් කැඳවීම සීමා කරන ලදී. • 10/2022 - සම්පත් හිඟය මත වියදම් අවම කර ගැනීම සඳහා රාජ්‍ය ආයතනවල කාර්ය මණ්ඩලය කැඳවීමා සීමා කරන ලදී. • 04/2022 - රාජ්‍ය වියදම් කළමනාකරණය කර ගැනීම සඳහා විදුලිය හා ඉන්ධන අරපිරිමැස්මෙන් යුතුව භාවිතා කරන ලදී. • 14/2022 - රාජ්‍ය නිලධාරීන්ට දේශීය හා විදේශීය නිවාඩු ලබා ගැනීමට දිරිමත් කරන ලදී. • ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 අනුව රාජ්‍ය වියදම් පාලනය කිරීම සිදු කරන ලදී. ඉතිරි පුහුණු වැඩසටහන් ඉහත චක්‍රලේඛ මඟින් ලබා දුන් උපදෙස් අනුව දෙපාර්තමේන්තුව කටයුතු කළ නිසා සිදු කිරීමට නොහැකි වූ බවද සඳහන් කරමි. එසේම ඇමුණුම 03 හි සඳහන් පුහුණු වැඩසටහන් 2022 වර්ෂයේ සිදු කර ඇති බවද වැඩි දුරටත් පෙන්වා දෙමි.2023 වර්ෂය පුහුණු වැඩසටහන් 100% සිදු කර ඇති බවද 2024 වර්ෂය පුහුණු වැඩසටහන් මේ වන විට සිදු කරමින් පවතින බවද වැඩිදුරටත් සඳහන් කරමි.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 79 සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ඩී.ඩී.ඉ.ඒ. සෙනෙවිරත්න
අධ්‍යක්ෂ ජනරාල්
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
"සංඛ්‍යාන මන්දිරය"
අංක 306/71, පොල්දූව පාර, බත්තරමුල්ල.

ඇමුණුම 01

භාණ්ඩාගාර අභ්‍යාසය	වර්තමාන තත්වය					
		නම හා තනතුර	දක්වා ඇති ශේෂය රු.	ණය අයකර ගැනීම රු.	2024.07.31 දිනට ශේෂය රු.	ණය අයකර ගැනීමට ගෙන ඇති පියවර
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණයශේෂ පැවතීම.	(අ) . මිය ගිය නිලධාරීන් රු. 571,239.00	1. කේ.විග්නේෂ්වරන් (කේත ලිපිකරු)	92,750.00	-	92,750.00	මෙම නිලධාරියාගේ අයවිය යුතු ණය මුදල් මරණ පාරිතෝෂිකයෙන් අයකර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් කළමනාකරණ පද්ධතිය වෙත යොමු කර ඇත.
		2. ඒ.පී .සිංගක්කුට්ටි ආරච්චි (තො.ස.තා.ස.)	236,160.00	-	236,160.00	මෙම නිලධාරියාගේ අයවිය යුතු ණය මුදල් මරණ පාරිතෝෂිකයෙන් අයකර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් කළමනාකරණ පද්ධතිය වෙත යොමු කර ඇත.
		3. ඊ.එස්.සී.දයාරත්න (සංඛ්‍යාලේඛන නිලධාරී)	65,900.00	65,900.00	-	2022 ඔක්තොම්බර් මස දී නිරවුල් කර ඇත.
		4. ඩබ්.ඒ.එස්.ආර්.ජයලාල් (ජයලාල්)	176,429.00	-	176,429.00	මෙම නිලධාරියාගේ අයවිය යුතු ණය මුදල් මරණ පාරිතෝෂිකයෙන් අයකර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් කළමනාකරණ පද්ධතිය වෙත යොමු කර ඇත.
	එකතුව		**571,239.00**	**65,900.00**	**505,339.00**	
	(ආ). සේවය හැර ගිය නිලධාරීන් රු.634,661.00	1. ඩබ්.එම්.ජේ.සී.වීරකෝන් (සංඛ්‍යාලේඛන නිලධාරී)	27,080.00	-	27,080.00	රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2024 අනුව ණය ශේෂ කපා හැරීමට අදාල නිර්දේශ ඇතුලත් වාර්තාවක් පිළියෙල කර ඉදිරිපත් කරන ලෙස දන්වමින් දෙපාර්තමේන්තු කමිටුවක් පත් කර ඇත.
		2. ඒ.ජී.එම්.එස්.කුමාර (සංඛ්‍යාලේඛන නිලධාරී)	38,410.00	-	38,410.00	රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2024 අනුව ණය ශේෂ කපා හැරීමට අදාල නිර්දේශ ඇතුලත් වාර්තාවක් පිළියෙල කර ඉදිරිපත් කරන ලෙස දන්වමින් දෙපාර්තමේන්තු කමිටුවක් පත් කර ඇත.
		3. ඩබ්.ඒ.ජේ.එස්.කුමාර (කේත ලිපිකරු)	47,150.00	-	47,150.00	රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2024 අනුව ණය ශේෂ කපා හැරීමට අදාල නිර්දේශ ඇතුලත් වාර්තාවක් පිළියෙල කර ඉදිරිපත් කරන ලෙස දන්වමින් දෙපාර්තමේන්තු කමිටුවක් පත් කර ඇත.
		4. කේ.එම්.ඩී.ආර්.ප්‍රියදර්ශනී (කේත ලිපිකරු)	78,200.00	-	78,200.00	මෙම නිලධාරියාගේ පදිංචිය පිළිබඳ තොරතුරු සොයා ගත නොහැකි අතර විදේශගත වී ඇත්ද යන්න සොයා බැලීමට යොමු කරන ලද ලිපියට අදාලව 2024.02.22 වන දින සිහි කැඳවීමේ ලිපියක් ද ආගමන විගමන දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණයශේෂ පැවතීම.		5. එම්.ජී.ඩී.කේ. ප්‍රියකැළුම් (කා.සේ.සේ.)	104,250.00	-	104,250.00	මු.රෙ. 109 යටතේ ණය ශේෂය කපා හැරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
		6. එම්.එස්.එම්.සෆ්රාස් (කා.සේ.සේ.)	59,784.00	-	59,784.00	නඩු පැවරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර වර්තමාන තත්වය 2024.05.16 දිනැති ලිපි මඟින් විමසා ඇත.
		7. එම්.බී.ආර්.ජේ.බණ්ඩාර (සංඛ්‍යාලේඛන නිලධාරී)	95,140.00	-	95,140.00	මෙම නිලධාරියාගේ ණයශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් කොළඹ දිසා අධිකරණයේ නඩු අංක DMR/2724/2020 යටතේ පවරා ඇති නඩුව, වැඩිදුර විභාගය 2024.08.01 දින පැවති අතර,ඊට නිලධාරී මහතා ඉදිරිපත් නොවිය. මෙම නඩුවට අදාල ආපදාණය ඉල්ලුම් පත්‍රය, ණයකරු හා ආයතනය විසින් අත්සන් කරන ණය ගිවිසුමේ මුල් පිටපත් අස්ථානගත වීම හේතුවෙන් ඒවායේ පිටපත් පමණක් උසාවියට ඉදිරිපත් කරන ලද නිසා මීලග නඩු දිනයේදී ඒවායේ මුල් පිටපත් උසාවියට ඉදිරිපත් කරන ලෙස දන්වා නඩුව 2024 දෙසැම්බර් මාසය දක්වා කල්තබන ලදි. මෙම අස්ථානගත වීම සම්බන්ධයෙන් අභ්‍යන්තර විමර්ශනයක් සිදු කිරීමට නියමිතව ඇත.
	(ආ). සේවය හැර ගිය නිලධාරීන් රු.634,661.00	8. ටී.එන්.පිටිගල (තො.ස.තා.ස)	107,200.00	-	107,200.00	මෙම නිලධාරියාගේ පදිංචිය පිළිබඳ තොරතුරු සොයා ගත නොහැකි අතර 2023.12.08 දිනැති ලිපිය මඟින් එම නිලධාරිනිය පදිංචි ස්ථානය පිළිබඳව පවුලේ ඥාතීන්ගෙන් විමසිම් කර දන්වන ලෙස ප්‍රාදේශීය ලේකම් වෙත ලිපියක් යොමු කර ඇත.
		9. ආර්.පී.එස්.කේ.සේනාරත්න (සංඛ්‍යාලේඛන නිලධාරී)	3,200.00	3,200.00	-	2023 සැප්තැම්බර් මස දී ණය ශේෂය නිරවුල් කර ඇත.
		10. ජී.එන්.පෙරේරා (සංඛ්‍යාලේඛනඥ)	23,320.00	23,320.00	-	2023 ජූනි මස දී ගිණුම් පොත් වලින් කපා හැර ඇත.
		11. එම්.ඒ.ඩී.ජී.පෙරේරා (කා.සේ.සේ.)	27,305.00	27,305.00	-	2022 දෙසැම්බර් මස දී ගිණුම් පොත් වලින් කපා හැර ඇත.
		12. ආර්.පී.එල්.සුසන්ත (කා.සේ.සේ.)	17,050.00	17,050.00	-	2023 ඔක්තෝම්බර් මස දී ගිණුම් පොත් වලින් කපා හැර ඇත.
		13. ටී.එච්.සරත් (කා.සේ.සේ.)	6,572.00	6,572.00		2022 නොවැම්බර් මස දී ණය ශේෂය නිරවුල් කර ඇත.
	එකතුව		**634,661.00**	**77,447.00**	**557,214.00**	
	(ඇ). විශ්‍රාම ගිය නිලධාරීන් රු.82,790.00	1. එච්.ඒ.ආර්.එස්.කේ.ජයසේකර (කා.සේ.නි.)	82,790.00	82,790.00	-	2022 අගෝස්තු මස දී ණය ශේෂය නිරවුල් කර ඇත.
	එකතුව		**82,790.00**	**82,790.00**	-	





ඇමුණුම 02


Training Schedule of Department of Census and statistics from 2023 - 2024

Sn.	Training programme	2023																																							
		Jan				Feb				March				April				May				June				July				August				Sep				Oct				Nov				Dec			
		1	2	3	4	1	2	3	4	1	2	3	4	1	2	3	4	1	2	3	4	1	2	3	4	1	2	3	4	1	2	3	4	1	2	3	4	1	2	3	4	1	2	3	4	1	2	3	4
1	නිල සංඛ්‍යාති / දර්ශකාංක පිළිබඳ දැනුවත් කිරීම - "ක්ෂේත්‍ර සං.නි. ගේ අත්දැකීම් හා මුහුණපාන අභියෝග" (online)																																												
2	නිල සංඛ්‍යාති / දර්ශකාංක පිළිබඳ දැනුවත් කිරීම - "දෙමළ මාධ්‍ය වැඩසටහන ශ්‍රමබල සමීක්ෂණ නිරසර සංවර්ධන දර්ශකාංක" (online)																																												
3	නිල සංඛ්‍යාති / දර්ශකාංක පිළිබඳ දැනුවත් කිරීම - "අභියෝග හමුවේ ඉදිරි දශකයේ දත්ත රැස්කිරීම" (online)																																												
4	නිල සංඛ්‍යාති / දර්ශකාංක පිළිබඳ දැනුවත් කිරීම - "ආපදා හා දේශගුණික විපර්යාස වලින් සංවර්ධන ක්‍රියාවලියට වන බලපෑම තක්සේරු කිරීමේදී DCS හි කාර්යභාරය" (online)																																												
5	නිල සංඛ්‍යාති / දර්ශකාංක පිළිබඳ දැනුවත් කිරීම - "දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන																																												

	අංශයක් ලද ජයග්‍රහනයක් - කුරුණෑගල"	
6	Non-communicable diseases by Dr.Lalith Ekanayaka - Lanka Hospital	
7	ක්ෂේත්‍ර අධ්‍යන චාරිකාව, ආර්ථික විද්‍යා අධ්‍යන අංශය- රුහුණු විශ්වවිද්‍යාලය	
8	නායකත්වය, නිර්මාණශීලිත්වය සහ උපරිම කාර්ය සාධනය පිළිබඳ දේශනය	
9	ක්ෂේත්‍ර අධ්‍යන චාරිකාව, ගණිත අධ්‍යන අංශය- රුහුණු විශ්වවිද්‍යාලය	
10	නිල සංඛ්‍යාති / දර්ශකාංක පිළිබඳ දැනුවත් කිරීම - "දෙමළ මාධ්‍ය වැඩසටහන සංගණන ඉතිහාසය හා 15 වන සංගණනය"	
11	නිල සංඛ්‍යාති / දර්ශකාංක පිළිබඳ දැනුවත් කිරීම - "Crypto curency and Blockchain හඳුන්වාදීම"	
12	නිල සංඛ්‍යාති / දර්ශකාංක පිළිබඳ දැනුවත් කිරීම - "පාරිභෝගික මිල දර්ශක පාද වර්ෂ යාවත්කාලීන කිරීම"	
13	නිල සංඛ්‍යාති / දර්ශකාංක පිළිබඳ දැනුවත් කිරීම - "MRCB 2022 හඳුන්වාදීම දෙවන කොටස"	
